# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1762/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 27/11/2024 පැය 1105

## මාධ්‍ය නිවේදනය

**අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් යාපනය ඒ- 09 මාර්ගයේ ගමනාගමනය සීමා කිරීම - ඕමන්ත පොලිස් වසම.**

දිවයිනට බලපා ඇති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ඕමන්ත පොලිස් වසමේ නොච්චිමොටේ පාලම අසලින් හා ඕමන්ත නගරය ආසන්නයේ මාර්ගය ජලයෙන් සම්පූර්ණයෙන් යට වී ඇත.

ඒ හරහා ගමන් කරන යතුරුපැදි හා මෝටර් රථ වැනි සහැල්ලු වාහන සඳහා ගමන් කිරීමට හැකියාවක් නොමැති අතර ලොරි රථ හා බස් රථ වැනි බර වාහන සඳහා පමණක් ගමන් කිරීමට හැකියාව ඇත.

ඒ අනුව ඕමන්ත පොලිස් වසම හරහා ඒ - 09 මාර්ගය භාවිතා කරන මහජනතාව සහ රියදුරන්ට ආපදා තත්ත්වය පහව යන තෙක් පහත විකල්ප මාර්ගය භාවිතා කල හැක.

**විකල්ප මාර්ගය,**

- වව්නියාව දෙස සිට යාපනය දක්වා සහ යාපනය දෙස සිට වව්නියාව දක්වා ගමන් කරන සැහැල්ලු වාහන මන්නාරම මාර්ගයේ ඒ-32 මාර්ගයේ වව්නියාව,සෙට්ටිකුලම, මන්නාරම හරහා යාපනය මාර්ග භාවිතා කල හැක.

ඉහත නිවේදනය සම්බන්ධයෙන් මහජනතාවගේ දැනගැනීම සඳහා ඔබ මාධ්‍ය ආයතනය මගින් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**